Part 01

Basic English Grammar

මූලික ඉංග්‍රීසි ව්‍යාකරණ

SEtranslator

KWD Sandun Sirikumara
Sworn Translator/English Tutor/Former Banker

Content

Parts of the speech

- Nouns
  - Kinds of nouns 4
  - List of nouns 6
  - Articles 9
  - Pluralization 11
- Personal pronouns 12
- Verbs
  - Kinds of verbs 13
  - Guide to Am/is/are 15
  - Auxiliaries 16
  - Modal verbs 19
  - Conjugation of verbs 21
  - Regular verb list 22
  - Irregular verb list 23
- Adjectives
  - Kinds of adjectives 24
  - Comparison of adjectives 25
  - List of common adjectives 26
  - Adjectives for your speech 28

Tenses

- Active voice tenses
  - Simple present 29
  - Present continuous 32
  - Present perfect 34
  - Present perfect continuous 36
  - Simple past 38
  - Past continuous 40
  - Past perfect 42
  - Past perfect continuous44
  - Simple future 46
  - Future continuous 48
  - Future perfect 50
  - Future perfect continuous 52
  - Usage chart 54

SEtranslator

- Passive voice tenses 55
  - Simple present 58
  - Present continuous 59
  - Present perfect 60
  - Simple past 61
  - Past continuous 62
  - Past perfect 63
  - Simple future 64
  - Future perfect 65

- Active to Passive 66

Questions

- Yes / No questions 67
- Question tags 68
- 'Wh' questions 69
- Asking Questions – How 71
- Parts of a question 72

Supportive lessons

- Affixes 73
- Usage of 'ish' 74
- Also / too / as well as 75
- Because/because of 76
- Being 77
- Commands 78
- Common mistakes 79
- Despite 80
- Direct & indirect speech (Reported speech) 81
- Enough 84
- Even 85
- Have / having / have to / have got 86
- Later & latter 87
- Let / Lets / Let's 88
- Usage of 'make' 89
- Neither nor / either or 91
- Should / could / would 92
- Sometimes / sometime / some time 95
- Still / till / until / yet 96
- There is / there are 97

SEtranslator

- Was to / was to have / was going to / was about to 98

Spoken English

- Silent letters 100
- Wrong pronunciation 101
- Informal contractions 102
- Linking rules 103
- Slangs 105
- Practical phrases 106
- Spoken English basics 107
- Spoken phrases 110
- Self-introduction 113
- Tongue twisters 115

SEtranslator

Nouns – නාමපද

අප පළමුව ඉංග්‍රීසි භාෂාවේ නාමපද බෙදෙන ආකාරය සහ එම නාමපද වල ලක්ෂණ හඳුනාගනිමු.

- Animate and inanimate (ප්‍රාණවාචී සහ අප්‍රාණවාචී)
- Masculine, feminine and Neuter (පුරුෂ ලිංග, ස්ත්‍රී ලිංග සහ නපුංසක ලිංග)
- Countable and uncountable (ගණන් කළහැකි සහ ගණන් කළ නොහැකි)
- Concrete nouns and abstract nouns (ප්‍රත්‍යක්ෂ නාම සහ භාව නාම)
- Common nouns (පොදු නාම)
- Proper nouns (විශේෂ නාම)
- Collective nouns (සමූහාර්ථවාචී නාම)

Animate nouns

- පණ ඇති දේවල් මෙයට අයත් වේ. (පුද්ගලයින් සහ සත්වයින්)
- EX: man, women, dog, cat, fish

Inanimate nouns

- පණ නැති දේවල් මෙයට අයත් වේ. (භෞතික වස්තූන්)
- EX: desk, chair, tree, house, van

Masculine gender

- පුරුෂ ලිංග නාමපද මෙයට අයත් වේ.
- EX: man, boy, prince, actor, emperor

Feminine gender

- ස්ත්‍රී ලිංග නාමපද මෙයට අයත් වේ.
- EX: women, girl, princess, actress, empress

Neuter gender

- නපුංසක ලිංග නාමපද මෙයට අයත් වේ.
- EX: tree, house, road, metal, sand

Countable nouns (discrete nouns)

- අංකමය වශයෙන් ගණන් කළහැකි නාම මේවාට අයත් වේ.
- EX: pen, box, paper, car, house

SFtranslator

Uncountable nouns (mass nouns)

- අංකමය වශයෙන් ගණන් කළ නොහැකි නාම මේවාට අයත් වේ.
- EX: sugar, milk, water, sand, tea

Concrete nouns

- පංච ඉංද්‍රියන්ට ගෝචර වන දෑ මෙයට අයත් වේ.
- Abstract නාමපද හැර අන් සියල්ල මෙයට අයත් වේ.

Abstract nouns

- හැඟීම්, අදහස්, මතවාද, සංකල්ප, විශ්වාසයන්, ගතිගුණ ඇතුළු පංච ඉන්ද්‍රියන්ට ගෝචර නොවන නාම මෙයට අයත් වේ.
- EX: love, education, power, kindness, poverty, peace

Common nouns

- පොදුවේ වස්තූන්, පුද්ගලයන් හා ස්ථානයන් හඳුන්වන නාම.
- EX: teacher, country, city, book, students

Proper nouns

- විශේෂයෙන් පුද්ගලයෙක්, ස්ථානයක් හෝ වස්තුවක් හඳුන්වන නාම.
- EX: Sri Lanka, Kasun, The Tripitaka, Madolduwa, America

Collective nouns

- සමූහයක් යන අර්ථය දෙන නාමපද.
- EX: herd, bunch, crowd, team, group

මතක තබාගන්න.

- Proper nouns හැමවිටම ඉංග්‍රීසි capital අකුරෙන් ආරම්භ වෙයි.
- Uncountable nouns, abstract nouns සහ proper nouns බහුවචනයට හැරවෙන්නේ නැති අතර මේවා සමග a, an යෙදෙන්නේ ද නැත.
- Collective nouns සමග යෙදෙන වෙනත් නාමපද බහුවචන ස්වරූපයෙන් තබයි.
    - EX: Herd of <u>elephants</u>, bunch of <u>flowers</u>
- Uncountable nouns මිණුම් ඒකක ඔස්සේ මැණිය හැකි අතර එම ඒකක බහුවචනයට හැරවිය හැක.
    - EX: <u>Glasses</u> of water, <u>two packets</u> of milk

SEtranslator

List of Nouns

Abstract nouns - භාව නාම		
	Word	**Meaning**
1	Length (Adj. long)	දිග
2	Youth (Adj. young)	තරුණ
3	Width (Adj. wide)	පළල, මහත
4	Strength (Adj. strong)	බලය, ශක්තිය, හයිය
5	Truth (Adj. true)	ඇත්ත, යථාර්ථතය
6	Depth (Adj. deep)	ගැඹුර
7	Freedom (Adj. free)	නිදහස
8	Bravery (Adj. brave)	නිර්භීතකම
9	Height (Adj. high)	උස, ඉහළ
10	Poverty (Adj. poor)	දුප්පත්කම
11	Darkness (Adj. dark)	අඳුර
12	Brightness (Adj. bright)	දීප්තිය, බැබළීම
13	Kindness (Adj. kind)	කරුණාවන්ත බව
14	Humbleness (Adj. humble)	නිහතමානී බව
15	Pride (Adj. proud)	ආඩම්බර කම, මානය
16	Foolish (Adj. fool)	මෝඩකම, මෝඩ, බොලඳ
17	Wealthy (Adj. rich)	පොහොසත්කම, ධනවත්
18	Laughter (V. laugh)	සිනහව, හාස්‍යය
19	Life (V. live)	ජීවිතය
20	Hatred (V. hate)	වෛරය, ද්වේෂය
21	Choice (V. choose)	තේරීම, තීරණය
22	Movement (V. move)	චලනය
23	Judgment (V. judge)	විනිශ්චය, තීන්දුව
24	Action (V. act)	ක්‍රියාව
25	Knowledge (V. know)	දැනුම
26	Belief (V. believe)	විශ්වාසය, අදහීම
27	Thought (V. think)	සිතුවිල්ල, සංකල්පනාව, අදහස
28	Expectation (V. expect)	අපේක්ෂාව, බලාපොරොත්තුව
29	Discussion (V. discuss)	සංවාදය, සාකච්ඡාව
30	Improvement (V. improve)	අභිවෘද්ධිය, දියුණුව
31	Addition (V. add)	එකතුව, සංකලනය
32	Decision (V. decide)	තීරණය

eTranslator

Abstract nouns - භාව නාම		
	Word	**Meaning**
33	Investigation (V. investigate)	සමීක්ෂණය, විමර්ශනය
34	Adoption (V. adopt)	යොදා ගැනීම, භාර ගැනීම
35	Childhood (N. child)	ළමා කාලය
36	Kingdom (N. king)	රාජධානිය
37	Manhood (N. man)	පිරිමිකම, මනුෂ්‍යත්වය
38	Theft (N. thief)	සොරකම
39	Friendship (N. friend)	යහළුකම
40	Motherhood (N. mother)	මාතෘභාවය
41	Infancy (N. infant)	ළදරුවිය, ළදරුකම
42	Ownership (N. owner)	හිමිකම, අයිතිවාසිකම
43	Captaincy (N. captain)	නායකත්වය
44	Agency (N. agent)	කාර්යාංශය, නියෝජිත ආයතනය
45	Authority (N. author)	අධිකාරිය, බලධාරියා
46	Regency (N. regent)	ආධිපත්‍යය
47	Piracy (N. pirate)	මුහුදු කොල්ලය
48	Patriotism (N. patriot)	දේශානුරාගය, ජාත්‍යාලය
49	Gluttony (N. glutton)	කෑදරකම
50	Rascality (N. rascal)	තක්කඩිකම

Collective nouns - සමූහාර්ථවාචී නාම		
	Word	**Meaning**
1	Crowd	සමූහය, සේනාව, රංචුව, සෙනඟ
2	Mob	සමූහය, රැල
3	Flock	රෑන, රැල, රොත්ත, රංචුව, සමූහය
4	Herd	සමූහය, රංචුව, පට්ටිය
5	Army	සේනාව, බළ ඇණිය, හමුදාව
6	Fleet	නැව් කණ්ඩායම, නාවික බළ ඇණිය
7	Jury	ජූරි සභාව, විනිශ්චය සභාව
8	Nation	ජාතිය, වර්ගයා, දෑය, දේශය
9	Committee	කමිටුව, කාරක සභාව, කොමිටිය
10	Team	කණ්ඩායම, හවුල, බාන

SEtranslator

Masculine and Feminine nouns
පුරුෂ ලිංග හා ස්ත්‍රී ලිංග නාමපද

Masculine gender	Feminine gender
Man (මිනිසා)	Woman (ගැහැණිය)
Prince (කුමරා)	Princess (කුමරිය)
Actor (නළුවා)	Actress (නිලිය)
King (රජ)	Queen (රැජින)
Emperor (අධිරාජයා)	Empress (අධිරාජිනිය)
Bachelor (අවිවාහක පුරුෂයා)	Spinster (අවිවාහක ගැහැණිය)
Bridegroom (මනාලයා)	Bride (මනාලිය)
God (දෙවියා)	Goddess (දෙව් දුව)
Governor (පාලකයා)	Matron (පාලිකාව)
Heir (උරුමක්කරු)	Heiress (උරුමක්කාරිය)
Hero (වීරයා)	Heroine (වීරවරිය)
Monk (භික්ෂුව)	Nun (භික්ෂුණිය)
Poet (කවියා)	Poetess (කිවිදිය)
Widower (වැන්දඹු පුරුෂයා)	Widow (වැන්දඹු ස්ත්‍රිය)
Uncle (මාමා)	Aunt (නැන්දා)
Brother (සහෝදරයා)	Sister (සහෝදරිය)
Father (තාත්තා)	Mother (අම්මා)
Gentleman (මහත්මයා)	Lady (මහත්මිය/මැතිනිය/ආර්යාව)
Boy (කොල්ලා)	Girl (කෙල්ල)
Father-in-law (මාමණ්ඩි)	Mother-in-law (නැන්දම්මා)

SEtranslator

Articles – අව්‍ය පද

බැලූ බැල්මට සරල ඉංග්‍රීසි ව්‍යාකරණ කොටසක් ලෙස පෙනුන ද බහුල වශයෙන් යෙදෙන ඉතාමත් වැදගත් කොටසක් ලෙස හැඳින්විය හැක. එහි ප්‍රධාන කොටස් 2කි.

- Indefinite articles (a, an)
- Definite articles (the)

Indefinite articles

- මෙමගින් a හා an යන පදවල යෙදීම පිළිබඳව සාකච්ඡා කරමු.
- ප්‍රාණවාචී හෝ අප්‍රාණවාචී දෑ අතුරින් යම් දෙයක් එකක් ලෙස වෙන්කර දැක්වීම. එසේත් නැතිනම් ඒකවචන සොබාවය දැක්වීම සඳහා a හා an භාවිත කරයි.
  Ex: a boy (පිරිමි ළමයෙක්) an apple (ඇපල් ගෙඩියක්)
- එමනිසා ගණන් කළහැකි ඒකවචන නාමපද සමග පමණක් a හා an යෙදෙයි. පහත වගුවෙන් එය වඩාත් පැහැදිලි කරගන්න.

Countable nouns (ගණන් කළහැකි නාම)	**Used**
Collective nouns (සමූහාර්ථවාචී නාම)	**Used**
Common nouns (පොදු නාම)	**Used**
Proper nouns (විශේෂ නාම)	**Not Used**
Abstract nouns (භාව නාම)	**Not Used**
Uncountable nouns (ගණන් කළ නොහැකි නාම)	**Not Used**
Pronouns (සර්වනාම)	**Not Used**

ඇතැම් යෙදීම් මත abstract nouns සමග a හා an යොදයි.
Ex: What a shame! (මොනතරම් ලැජ්ජාවක්ද/නින්දාවක්ද)

- නාම විශේෂණ සමග නාමපද යෙදෙන විටදී නාම විශේෂණයට පෙර a හා an යොදයි.
  Ex: a red pen (රතු පැනක්) an orange juice (දොඩම් පානයක්)
- **දැන් අපි බලමු a හා an ලෙස පද දෙකක් දැක්වීමේ හේතුව පිළිබඳව.**
- ස්වර ශබ්දයකින් ආරම්භවන නාමපද මුලට an ද ව්‍යංජන ශබ්දයකින් ආරම්භවන නාමපද මුලට a ද යොදයි.
  Ex: a book a university a school a year
  an hour an umbrella an ice-cream an axe

SEnglish

- බහුවචන හෝ ගණන්කළ නොහැකි පද සමග a හා an වෙනුවට a few, some, several වැනි පද යොදාගනියි.
  Ex: a few bottles some sugar several books

Definite articles

- මෙමගින් the යන පදයෙහි යෙදීම පිළිබඳව සාකච්ඡා කරමු.
- යම් ස්ථානයක් තුල එක් දෙයකින් එකක් පමණක් තිබේනම් එය හැඳින්වීමට the යොදයි.
  Ex: <u>The principal</u> of the school. The sun The sky
- යමක් දෙවැනිවර වෙන්කර දැක්වීමේ දී the යොදයි.
  Ex: There is a cafe near my home. I go to <u>the cafe</u> every day.
- ඉහළම තත්වය හැඳින්වීමේ දී the යොදයි. (Superlatives)
  Ex: Mahaweli is <u>the longest</u> river in Sri Lanka.
- ක්‍රමාංකික ලෙස ගණනයන් දැක්වීමේ දී the යොදයි. (Ordinal numbers)
  Ex: He won <u>the first</u> place.
- පොදුවේ යම් දෙයක්/සමූහයක් හැඳින්වීමේ දී the යොදයි.
  Ex: <u>The students</u> should bring their report cards.
- යම් උතුම්, ශ්‍රේෂ්ට, ප්‍රසිද්ධ දෙයක් හැඳින්වීමේ දී the යොදයි.
  Ex: The lord Buddha The Tripitaka The Bible
- පුද්ගල නාම සමග the නොයෙදෙයි.
  Ex: The Sunil X The Perera X
- ස්ථාන නාම සමග the නොයෙදෙයි. (විශේෂ අවස්ථාවන් හී දී හැර)
  Ex: The Kalutara X The Samagi Mawatha X
  The Sri Lanka X The Australia X
- සර්වනාම සමග the යොදන්නේ නැත.
  Ex: the I X the me X the my X the mine X
  the someone X the anybody X
- මීට අමතරව භාෂාවන් සමග, ආහාර වේල් සමග, සතියේ දින සමග, වර්ෂ සමග, ඔරලෝසු වේලාවන් සමග the යොදන්නේ නැත.
- ස්වර ශබ්දයක් සහිත වචනයක් මුලට the යොදන විට එහි උච්චාරණය "දී" ලෙස ද, ව්‍යංජන ශබ්දයක් සහිත වචනයක් මුලට the යොදන විට එහි උච්චාරණය "ද" ලෙස ද යෙදේ.
  Ex: the book (ද බුක්) **the earth** (දී ඇර්ත්)

SLranslator

Pluralization (බහුවචනයට හැරවීම)

➢ මෙම පාඩම මගින් අපි නාමපදයක් බහුවචනයට හරවාගන්නා විවිධ ස්වරූපයන් ගැන සාකච්ඡා කරන්නෙමු.

1. Adding 's' to the end. (අගට **'s'** අක්ෂරය යෙදීම)

Ex: - boy - boys, pen - pens, girl - girls, book - books
desk - desks, cow - cows, cat - cats, pupil - pupils

2. Adding 'es' to the words ending with 's, ss, ch, o, x, sh'
(**'s, ss, ch, o, x, sh'** යන අක්ෂරවලින් අවසන් වන වචන අගට **'es'** යෙදීම)

Ex: - glass - glasses, class - classes, kiss - kisses, watch - watches
catch - catches, match - matches, potato - potatoes, hero - heroes
volcano - volcanoes, box - boxes, tax - taxes, fax - faxes
dish - dishes, brush - brushes, fish - fishes, wish - wishes

3. Adding 'ies' instead of 'y' proceeded by a consonant
(ව්‍යංජන අක්ෂරයක් සමග **'y'** අක්ෂරය අගට යෙදුනු විටදී, **'y'** වෙනුවට **'ies'** යෙදීම)

Ex:- baby - babies, lady - ladies, city - cities, story - stories, army - armies

4. Adding 'ves' instead of 'f' and 'fe'
(**'f, fe'** යන අක්ෂරවලින් අවසන් වන වචන අගට **'f, fe'** වෙනුවට **'ves'** යෙදීම)

Ex:- life - lives, wife - wives, knife - knives, leaf - leaves, thief - thieves

5. Changing inside vowels (වචනයෙහි ඇතුලත ස්වර වෙනස් කිරීම)

Ex:- man - men, woman - women, tooth - teeth, mouse - mice

➢ ඉහත ආකාරයන් හැරණුවිට වෙනස් ස්වරූපගන්නා නාමපද ද ඇත.

1. ලතින් වචන **(Latin words)**

Ex:- radius – radii, index – indices formula – formulae

2. ග්‍රීක වචන **(Greek words)**

Ex:- axis – axes crisis – crises analysis – analyses

3. බහුවචන ස්වරූපයක් නොමැති නාමපද **(words without a plural)**

Ex:- Abstract nouns uncountable nouns proper nouns
Furniture Jewelry News stationery

4. ඇතැම් නාමපදවල ඒකවචන හා බහුවචන ස්වරූපයන්ට වෙනම ම අර්ථයන් ඇත.

Ex:- Physic – ඖෂධය Physics – භෞතික විද්‍යාව

5. වෙනත් වචන

Ex:- child – children son-in-law – sons-in-law kilo – kilos

SEtranslator

Personal pronouns – පුද්ගල සර්වනාම

➢ නාම පදයක් වෙනුවට අදේශ කරනු ලබන පද සර්වනාම ලෙස හැඳින්වේ. Pronoun is a word which is used instead of a noun.(Replace noun)

		Subjective කතෘ ලෙස	Objective කර්මය ලෙස	Possessive අයිතිය හැඟවීම
First Person උත්තම පුරුෂ	**Singular**	I (මම)	Me (මට)	My, Mine (මගේ, මගේම)
	Plural	We (අපි)	Us (අපට)	Our, Ours (අපේ, අපේම)
Second Person මධ්‍යම පුරුෂ	**Singular**	You (ඔබ)	You (ඔබට)	Your, Yours (ඔබගේ, ඔබගේම)
	Plural	You (ඔබලා)	You (ඔබලාට)	Your, Yours (ඔබලාගේ, ඔබලාගේම)
Third Person ප්‍රථම පුරුෂ	**Singular**	He (ඔහු) She (ඇය) It (ඌ/ඒක)	Him (ඔහුට) Her (ඇයට) It (ඌට/එයට)	His (ඔහුගේ, ඔහුගේම) Her, Hers (ඇයගේ, ඇයගේම) Its (ඌගේ, ඌගේම)
	Plural	They (ඔවුන්)	Them (ඔවුන්ට)	Their, Theirs (ඔවුන්ගේ, ඔවුන්ගේම)

Reflexive & Intensive personal pronouns

Singular	Myself (මා විසින්), Yourself (ඔබ විසින්), Himself (ඔහු විසින්), Herself (ඇය විසින්), itself (ඌ විසින් / ඒ මතම)
Plural	Ourselves (අප විසින්), Yourselves (ඔබලා විසින්), Themselves (ඔවුන් විසින්)

Reflexive pronouns

මේ යටතේ ඇති සර්වනාම නැවතත් කතෘ වෙත යොමුවන අතර කතෘ විසින් තමාටම සිදුකරනු ලබන ක්‍රියාවක් විස්තර කරයි.

Ex: I saw myself in the mirror. (මම මාව ම කණ්ණාඩියෙන් දුටුවෙමි.)
We blame ourselves. (අපි අපට ම චෝදනා කරන්නෙමු.)

Intensive pronouns

කතෘ විසින් සිදුකරනු ලබන ක්‍රියාව අවධාරණ කොට දැක්වීම හෝ කතෘ වෙත විශේෂ අවධානයක් යොමුකිරීම.

Ex: I made it myself. (මා විසින් ම එය සෑදුවෙමි.)
She spoke me herself. (ඇය විසින් ම මට කතා කළා.)

ඉහත වාක්‍යයන් හි සැබෑ අදහස වනුයේ මම එය සෑදුවා සහ ඇය මට කතා කළා යන්නයි. විශේෂයෙන් අවධාරණය කිරීම සඳහා අතිරේක සර්වනාම පදයක් යොදාගෙන ඇත.

Sstranslation

Kinds of Verbs
ක්‍රියාපද වර්ග

- යම් ක්‍රියාවක්, තත්වයක් හෝ ඇතිවීමක් පිළිබඳ හැඟවීම සඳහා යොදන පද ක්‍රියාපද වේ.
- මේවා වාක්‍ය තුල යෙදෙන ආකාරය අනුව එහි ස්වරූපය, අර්ථය හා භාවිතය වෙනස් වේ.
- වාක්‍ය අයත් කාලය හා ඒක වචන බහු වචන බව ප්‍රකාශ කිරීම ද ක්‍රියාපදයක මූලික ලක්ෂණ වේ.

ප්‍රධාන බෙදීම් 2ක

- **Action verbs**
  ක්‍රියාරූපී බවක් හඟවන ක්‍රියාපද මේ ගනයට අයත් වේ.
  Ex: run, write, eat, play, listen

- **Non action verbs / Auxiliaries / Helping verbs**
  ක්‍රියාරූපී බවක් නොපෙන්වන ක්‍රියාපද මේ ගනයට අයත් වේ.
  Ex: am, is, are, was, were, will, can, could

Action verbs

- **Regular and Irregular verbs**

  ක්‍රියා පදයේ අතීතකාල සහ පුර්ව ක්‍රියා ස්වරූපය වරනැගෙන ආකාරය අනුව කොටස් 2කට බෙදේ. එනම් රටාවකට අනුව වරනැගෙන ක්‍රියා Regular verbs ද රටාවක් නොමැතිව වරනැගෙන ක්‍රියා Irregular verbs ද වේ.
  Regular verbs – play, help, work, look
  Irregular verbs – buy, put, hear, go

- **Finite and Nonfinite verbs**

  කතෘ කෙනෙක් සහිතව ප්‍රධාන ක්‍රියාව ලෙස ක්‍රියාකරමින් සම්පූර්ණ වාක්‍යයක් ගොඩනගන අවස්ථාව හෝ ක්‍රියාව Finite වන අතර වාක්‍යයක ප්‍රධාන ක්‍රියාව ලෙස යම් ක්‍රියාවක් නිරූපණය නොකරන අවස්ථාව හෝ ක්‍රියාපදය Nonfinite වේ.
  Nonfinite ක්‍රියාපද කාලය හෝ ඒක වචන බහු වචන ස්වරූපයට අනුව කිසිදු වරනැගීමක් නොකරයි.
  Nonfinite verbs - Infinitives, gerunds, participles

- **Transitive and Intransitive verbs**

  සෘජු කර්මයක් සහිත ක්‍රියාපදය Transitive වන අතර සෘජු කර්මයක් නොමැති ක්‍රියාපදය Intransitive වේ.

SETranslator

- **Conjugation of verbs (ක්‍රියාපද වරනැගීම)**

  මේ යටතේ ක්‍රියාපද කොටස් 5කට වරනැගෙයි.
  Base form, Simple present singular form, past form, present participle form and past participle form
  (මෙහි ඇතැම් වරනැගීම් ක්‍රියා නාම (verbal nouns) ලෙස ද භාවිත කරයි.)

- **Phrasal verbs**

  ක්‍රියාපදයක් සමග තවත් ව්‍යාකරණ කොටසක් (බොහෝවිට නිපාතයක්) එක් වී තනි අර්ථයක් ගොඩනගන ක්‍රියා.
  Ex: stand up, get down, turn off, run out

Non action verbs / Auxiliaries / Helping verbs

මෙම ගනයේ ක්‍රියාපද තොරතුරු ප්‍රකාශ කිරීමට හා ක්‍රියාරූපී ක්‍රියාපද (action verbs) සමග උපකාරක ක්‍රියාවක් ලෙස භාවිත කරයි.

- **'be' verbs**
  තොරතුරු ප්‍රකාශනයේ දී තනි ක්‍රියාපදයක් ලෙස ද යෙදෙයි. ප්‍රශ්නාර්ථය හා නැත යන අර්ථය ගොඩනගයි. උපකාරක ක්‍රියාවක් ලෙස සියලු කාලයන් හී දී යෙදෙයි.
  be, am, is, are, was, were, being, been

- **'do' verbs**
  තනිව යෙදෙන විට action verb එකකි. ප්‍රශ්නාර්ථය හා නැත යන අර්ථය ගොඩනගයි. සරල වර්තමාන කාලයේ දී හා සරල අතීත කාලයේ දී උපකාරක ක්‍රියාවක් ලෙස යෙදෙයි.
  do, does, did **(මේවා ක්‍රියාරූපී ක්‍රියාපද ලෙසද ක්‍රියා කරයි.)**

- **'have' verbs**
  තොරතුරු ප්‍රකාශනයේ දී තනි ක්‍රියාපදයක් ලෙද යෙදෙයි. Perfect tenses සමග උපකාරක ක්‍රියාවක් ලෙස යෙදෙන විට ප්‍රශ්නාර්ථය හා නැත යන අර්ථය ගොඩනගයි.
  has, have, had
  has been, have been, had been **(be සහ have verbs වල එකතුවකි)**

- **'modal' verbs**
  Action verb එකක ක්‍රියාරූපී බවට යම් විවිධත්වයක් හා අර්ථගැන්වීම් එකතු කිරීමට යොදාගනියි.
  will, would, shall, should, can, could, may, might, must

SEtranslator

Part 02

Advanced English Grammar

උසස් ඉංග්‍රීසි ව්‍යාකරණ

SEtranslator

KWD Sandun Sirikumara
Sworn Translator/English Tutor/Former Banker

Content

Complex sentences

- Complex writing guide 119
- Clauses 123
- Parts of a sentence 124
- Parts of a complex sentence 125
- Forms of sentences 126
- Infinitive form 127
- Be + infinitive 129
- Punctuations 130

Parts of the speech

- Nouns
  - Verbal nouns 133
  - Gerunds 134
  - Noun clauses 135
- Pronouns
  - Relative pronouns 136
  - Relative clauses (who, whom, whose, that, which) 137
  - Other relative clauses (when & where) 141
  - Omitting the relative pronoun 142
  - Quantifiers and relative pronouns 143
- Verb patterns 144
  - Subject+Verb 145
  - S+V+Complement 145
  - S+V+Direct object 146
  - S+V+I/O+D/O 147
  - S+V+D/O+P+P/O 148
  - S+V+N/P+Adjective 149
  - S+V+P+P/O 150
  - S+V+to infinitive 141
  - S+V+N/P+to infinitive 152
  - S+V+Gerund 153
  - S+V+N/P+Pre/P 154
  - S+V+N/P+Plain infinitive 155

SEtranslator

- S+V+N/P+Past participle 156
- S+V+N/P+Complement 157
- S+V+That clause 158
- S+V+N/P+That clause 159
- S+V+Interrogative clause 160
- S+V+N/P+I/C 161
- S+V+I+to infinitive 162
- S+V+N/P+I+to infinitive 163

- Adverbs
  - Introduction to adverbs 164
  - Formation of adverbs 165
  - Position of adverbs 166
  - Comparison of adverbs 167
  - Kinds of adverbs
    - Degree/quantity 168
    - Frequency 169
    - Manner 170
    - Place 171
    - Time 172
  - Adverbial clauses 173

- Prepositions
  - Common prepositions 174
    (in, at, on, of, from, to, by, for, with, since, about, as)
  - Other prepositions 186
    (above, across, along, among, around, beside, beneath, between, beyond, within, without, according to, in accordance with, in addition to, in case of, in order to, in favour of, in compliance with, in front of, with reference to, in this regard, on behalf of)

- Conjunctions
  - Introduction to conjunctions 189
  - Cumulative conjunctions 191
  - Adversative conjunctions 192
  - Disjunctive conjunctions 193
  - Illative conjunctions 194
  - Conjunctions of Time 195
  - Conjunctions of Cause/Reason 196
  - Conjunctions of purpose 197

SEtranslator

- Conjunctions of Result 198
- Conjunctions of Condition 199
- Conjunctions of Concession 200
- Conjunctions of Comparison 201

Complex writing

- Advanced passive voice
  - Tense selection - passive voice 203
  - Subjectless passive voice 206
  - Passive voice & Transitive verb 207
  - Stative passives 208
  - Usage of 'Be' verbs 209

- Conditional clauses (if clauses) 211
- Writing styles 214
- Summarizing 215
- Paraphrasing 217
- Essay writing guide 219
- Letter writing
  - Letter writing guide 222
  - Letter headlines 225
  - Letter writing phrases 226

SEtranslator

Guide on making Complex Sentences
සංකීර්ණ වාක්‍ය ගොඩනැගීමේ මාර්ගෝපදේශය

What is a complex sentence / සංකීර්ණ වාක්‍යයක් යනු කුමක් ද?

යම් ක්‍රියාවක, සිදුවීමක හෝ තොරතුරක ප්‍රධාන විෂය කරුණට අමතරව ඒ සඳහා පාදක වූ පසුබිම, කාලය, හේතුව ආදී වූ වශයෙන් අතිරේක කොටස් එකතු කරමින් දීර්ඝ වාක්‍යයක් ගොඩනැගීම යි.

What are the grammatical parts required to build a complex sentence?
වාක්‍යයක් දීර්ඝ කිරීම සඳහා අවශ්‍යවන ව්‍යාකරණ කොටස් මොනවාද?

1. Tenses (කාලයන්ට අනුව වාක්‍යය ගොඩනැගීම)
2. Noun clauses (නාමපද වාක්‍යඛණ්ඩ)
3. Relative clauses (සම්බන්ධිත වාක්‍යඛණ්ඩ)
4. Adverbial phrases (ක්‍රියාවිශේෂණ මුල් වූ වාක්‍යඛණ්ඩ)
5. Conjunctions (සන්ධි පද)
6. Prepositions (නිපාත) - **adverbial phrases ගොඩනැගීම සඳහා**
7. Punctuation marks (විරාම ලක්ෂණ) - **සංකීර්ණ කොටස් වෙන්කිරීම සඳහා**

- ❖ ඉහත ව්‍යාකරණ කොටස් පිළිබඳව මනා අවබෝධයක් තිබිය යුතුයි.
- ❖ Tenses යන මූලික ව්‍යාකරණ කොටස මගින් සාදාගන්නා සරල වාක්‍යකට ඉහත ඇති ඉතිරි ව්‍යාකරණ කොටස් සම්බන්ධ කරමින් වාක්‍යය සංකීර්ණ කරනු ලැබේ.

What makes a sentence complex?
වාක්‍යයක් සංකීර්ණවන අවස්ථා

පර්පූර්ණ වාක්‍යයක් සමග අසම්පූර්ණ වාක්‍යඛණ්ඩ එකතු කිරීමෙන් සංකීර්ණ වාක්‍යයක් ගොඩනැගේ.

Independent clause + dependent clause(s)

1. වාක්‍යයක නාමපදයක් පිළිබඳව අතිරේක විස්තර එකතු කිරීමෙන් සංකීර්ණ වාක්‍ය ගොඩනැගේ. (Relative clauses)
2. වාක්‍යයක ක්‍රියාපදයක් පිළිබඳව අතිරේක විස්තර එකතු කිරීමෙන් සංකීර්ණ වාක්‍ය ගොඩනැගේ. (Adverbial phrases)
3. වාක්‍ය කිහිපයක් එකට එකතු කිරීමෙන් සංකීර්ණ වාක්‍ය ගොඩනැගේ. (Conjunctions)

SEtranslator

Let's make a complex sentence
දැන් අපි සංකීර්ණ වාක්‍යයක් ගොඩනගමු

Ex: My father is a doctor (මාගේ තාත්තා වෛද්‍යවරයෙකි)
I go to fair (මම පොළට යනවා)
I was late. There was a traffic jam (මම ප්‍රමාදයි. අධික වාහන තදබදයක් පැවතුනා)

ඉහත සඳහන් වාක්‍ය සියල්ල තනි අදහසක් ලබාදෙන සරල වාක්‍යය වේ. අපි දැන් එක් එක් වාක්‍යය වෙන වෙන ම සංකීර්ණ වාක්‍යයක් බවට හරවමු.

My father is a doctor

- ✓ මෙය තොරතුරු ප්‍රකාශිත වාක්‍යයකි.
- ✓ ඉහත වාක්‍යය සඳහා මගේ තාත්තා රැකියා කරන ස්ථානය එකතු කිරීමට අවශ්‍ය බව සිතන්න.
- ✓ මෙහි දී රැකියා කරන ස්ථානය සෘජුවම අදාළ වන්නේ මගේ තාත්තා කරනු ලබන වෘත්තියටයි. එනම් doctor කියන වචනයටයි.
- ✓ Doctor යන වචනය නාමපදයකි. එමෙන් ම එය මගේ තාත්තා පිළිබඳව යම් තොරතුරක් ලබාදෙයි.
- ✓ Doctor යන පදයට අතිරේක තොරතුරක් වශයෙන් රැකිය කරන ස්ථානය එකතුකරනු ලැබේ. ඒ සඳහා relative clause එකක් භාවිත කරයි.

My father is a doctor.
He works at Colombo Hospital. (පළමුව මෙලෙස දෙවන වාක්‍ය ද ගොඩනගන්න)

My father is a doctor who works at Colombo Hospital. (මගේ තාත්තා කොළඹ රෝහලේ සේවය කරන වෛද්‍යවරයෙකි.)

- ❖ ඉහත වාක්‍යයෙහි who යනු දෙවන වාක්‍යයෙහි He වෙනුවට යොදාගත් ආදේශක සර්වනාම සන්ධි පදය යි (Relative pronoun).
- ❖ Relative pronoun එකක් සමග ආරම්භවන වාක්‍ය කොටස relative clause එකක් ලෙස හැඳින්වේ.
- ❖ ඒ හා සමාන තවත් උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

- It is the ground where we played. (ඒක තමයි අපි සෙල්ලම් කරපු පිට්ටනිය.)
- He is the person whom I gave my note book.
  (ඔහුට තමයි මම මගේ සටහන් පොත දුන්නේ.)
- This is the book that everyone is talking about.
  (මේ පොත ගැන තමයි හැමෝම කතා කරන්නේ.)

SFTranslator

I go to fair

- ✓ මෙය ක්‍රියාවක් ප්‍රකාශ කරන වාක්‍යයකි.
- ✓ මෙහි ක්‍රියාවට අදාළ කාලය, කරනු ලබන ආකාරය, ක්‍රියාවට උපකාරී වන වෙනත් අය පිළිබඳව එකතු කිරීමට අවශ්‍ය බව සිතන්න.
- ✓ මෙහි දී ක්‍රියාවට සෘජුවම අදාළවන කොටසට පසුව ඉතිරි සියලු කොටස් එක්කරනු ලැබේ.
- ✓ යනවා (go) යන ක්‍රියාවට සෘජුවම අදාළ වන්නේ යන ස්ථානය යි. එම නිසා එම කොටසට පසුව අනෙක් කොටස් එක්කරනු ලැබේ.
- ✓ මේ සඳහා adverbial phrases භාවිත කරනු ලැබේ.

I go to fair.
with my mother / to buy some vegetables / in the morning

I go to fair in the morning with my mother to buy some vegetables (එළවළු කිහිපයක් මිලදීගැනීම සඳහා මම අම්මා සමග උදෑසන පොළට යමි.)

- ❖ මෙහි fair in the morning වෙනුවට morning fair ලෙස ද ලිවිය හැක.
- ❖ ඉහත වාක්‍ය සඳහා නිපාත පද (prepositions) භාවිත කරමින් ක්‍රියාවට අදාළ හේතුව, කාලය හා උපකාර වන අය පිළිබඳව සඳහන්කර ඇත.
- ❖ එවැනි වාක්‍ය කොටස් adverbial phrases ලෙස හැඳින්වේ.
- ❖ ඒ හා සමාන තවත් උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

- I went to the class yesterday to take some additional notes.
  (අතිරේක සටහන් කිහිපයක් ලබාගැනීම සඳහා මම ඊයේ පන්තියට ගියෙමි.)
- My mother is preparing meals for my friends.
  (මගේ අම්මා මගේ යහලුවන් වෙනුවෙන් ආහාර සකස්කරමින් සිටියි.)
- I go to school every day by bus.
  (මම දිනපතා බස්රියෙන් පාසල් යමි.)

I was late. There was a traffic jam

- ✓ ඉහත වාක්‍යය දෙකෙන් පළමු වාක්‍යයෙහි ඇති කරුණ සිදුවීමට අදාළ වූ හේතුව දෙවැනි වාක්‍යයෙන් සඳහන් කරයි.
- ✓ මෙහි නාමපදයක් ගැන හෝ ක්‍රියාපදයක් ගැන අර්ථ එක්කිරීමක් සිදු නොවේ. එම නිසා මේ සඳහා relative clauses හා adverbial phrases යොදාගත නොහැක.
- ✓ එම නිසා මේ සඳහා ගැලපෙන සන්ධි පදයක් භාවිත කළයුතු වේ.
- ✓ ඒ සඳහා අප හේතුව පිළිබඳව විමසන **because** යන සන්ධි පදය භාවිත කරමු.

Sethanslator

I was late.
There was a traffic jam.

I was late because there was a traffic jam. අධික වාහන තදබදය නිසාවෙන් මම ප්‍රමාද වුනා.

- ❖ මෙහි දී සන්ධි පදය සමග විරාම ලක්ෂණ (punctuation marks) යොදන ආකාරය පිළිබඳව ද සැලකිලිමත් විය යුතුයි.
- ❖ එකිනෙක මත සම්බන්ධ නොමැති වාක්‍ය (independent clauses) සම්බන්ධ කිරීමේ දී සන්ධි පදයට පෙර කමාව (comma) යොදනු ලැබේ.
  Ex: The rain stopped, and the sun came out again.
  (මෙහි වාක්‍ය දෙක එකිනෙක මත සම්බන්ධවීමක් නොපෙන්වයි.)
- ❖ ඇතැම්විට වාක්‍යයෙහි ඇති සංකීර්ණභාවය නිසා වාක්‍ය තේරුම්කර ගැනීමට අපහසු වන අවස්ථාවන්හී දී ද කමාව යොදනු ලැබේ.
- ❖ ඉහත සඳහන් සංකීර්ණ වාක්‍ය සඳහා තවත් උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

  - While I was going home, I saw an accident.
    (නිවසට යන අතරතුර දී මම අනතුරක් දුටුවෙමි.)
  - He is better than my brother.
    (මගේ සහෝදරයාට වඩා ඔහු හොඳයි.)
  - I was watching the TV when you called me.
    (ඔබ මට කතාකරන විට මම රූපවාහිනිය නරඹමින් සිටියෙමි.)

Some other ways that makes a sentence complex
වාක්‍යයක් සංකීර්ණවන වෙනත් ආකාරයන්

- ➢ සංකීර්ණ කතෘ කොටසක් භාවිත කිරීම.
  Ex: Sri Lanka, the pearl of the Indian Ocean is my country.
- ➢ නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ භාවිත කිරීම
  Ex: He is my school friend.
  I often go there.
- ➢ සන්ධි පදය ඉවත් කිරීම හෝ භාවිත නොකිරීමේ අවස්ථා.
  Ex: Things used to make a cake.
  (මෙහි which are used වෙනුවට used පමණක් යොදා ඇත.)
- ➢ විශේෂිත වචන හා වාක්‍යඛණ්ඩ භාවිත කිරීම.
  Ex: As a result of modern technology, communication is so convenience.
  Further, I can give some examples.
  It should be in accordance with the guidelines.

SEtranslator

Clauses – වාක්‍ය / වාක්‍යඛණ්ඩ

- කතෘ පදයක් හා ක්‍රියාපදයක් සහිත වාක්‍ය හෝ වාක්‍ය කොටසක් clause එකක් ලෙස හැඳින්වේ.
- සම්පූර්ණ අදහසක් ලබාදෙන clause එකක්, එසේත් නැතිනම් තනිව පැවතිය හැකි clause එකක් තනි වාක්‍යයක් (a sentence) ලෙස සැලකිය හැකි අතර ඒවා **independent clause (main clause)** ලෙස හඳුන්වයි.
- සම්පූර්ණ අදහසක් ලබානොදෙන clause එකක්, එසෙත් නැතිනම් අදහස සම්පූර්ණ කිරීමට තවත් වාක්‍ය කොටසක් අවශ්‍ය clause එකක් **dependent clause (subordinate clause)** ලෙස හඳුන්වයි. මෙය වාක්‍යඛණ්ඩයක් වේ (not a sentence).

Independent clause (main clause)

Ex: Ann completed her notes. (ඇන් ඇයගේ සටහන් සම්පූර්ණ කළාය.)
Gayan listened to music. (ගයාන් සංගීතයට සවන්දුන්නා.)

ඉහත සඳහන් වාක්‍යවල සම්පූර්ණ අදහසක් අන්තර්ගතවන අතර වාක්‍ය සම්පූර්ණ කිරීමට වෙනත් කොටස් එක්කිරීම අවශ්‍ය නොවේ. එම නිසා ඒවා complete sentences එසේත් නැතිනම් main clauses ලෙස හැඳින්විය හැක.

Independent clauses එකිනෙක සම්බන්ධ කිරීම සඳහා coordinating conjunctions යොදාගැනේ (and, but, for, nor, or, so, yet).

Ex: Ann completed her notes and Gayan listened to music.
(ඇන් ඇයගේ සටහන් සම්පූර්ණ කළ අතර ගයාන් සංගීතයට සවන්දුන්නා.)

Dependent clause (subordinate clause)

- මේවා වාක්‍යයක් තුල නාමපද (noun), නාම විශේෂණ (adjective) හෝ ක්‍රියා විශේෂණ (adverb) කොටසක් ලෙස ක්‍රියා කරයි.
- මේවා relative pronoun **(Ex: who, whom, that)** එකකින් හෝ subordinate conjunction **(Ex: although, because, if, when)** එකකින් ආරම්භ වේ.
- Noun clauses, relative clauses, adverbial clauses මේවා සඳහා නිදසුන් වේ.

Setranslator

Parts of a sentence – වාක්‍යක කොටස්



Parts of a complex sentence – සංකීර්ණ වාක්‍යක කොටස්



- මෙය වෙනත් කෙනෙකු විසින් මට පැවසූ දෙයක් මා නැවත පවසන හෙයින් indirect speech වේ.
- එම නිසා මෙහි will වෙනුවට would යන පදය යොදාගෙන ඇත.

- මෙහි ඇති relative clause එක කර්මකාරක (passive voice) වේ.
- එම clause එකෙහි ප්‍රධාන ක්‍රියාව වන appointed ට අදාළ වන කොටස් ඉන්පසුව වාක්‍යයට එක්කර ඇත.
- Appointed – as whom? (පත් කළේ කවුරුන් ලෙසද?) - **නව අධ්‍යක්ෂක ලෙස**
- Appointed – for what? (පත් කළේ මොකටද?) - **ව්‍යවස්ථානුකූලව නව රෙගුලාසි ස්ථාපිත කිරීමට**
- in order to / in accordance with - මේවා අර්ථ ගොඩනැගීමේ නිපාත පද (prepositions) වේ.

Parts of a complex sentence – සංකීර්ණ වාක්‍යක කොටස්
KWD Sandun Sirikumara | 0702684505 / 0755825908 | ssirikumara@gmail.com

Forms of a sentence – වාක්‍යක ස්වරූප

Sentence	Meaning
From Tenses	
I speak English	මම ඉංග්‍රීසි කතාකරනවා
I am speaking English	මම ඉංග්‍රීසි කතාකරමින් ඉන්නවා
I am going to speak English	මම ඉංග්‍රීසි කතාකරන්න හදන්නේ
I have spoken English	මම ඉංග්‍රීසි කතාකරලා තියෙනවා
I spoke English	මම ඉංග්‍රීසි කතා කළා
I was speaking English	මම ඉංග්‍රීසි කතාකරමින් හිටියා
I had spoken English	මම ඉංග්‍රීසි කතාකරලා තිබුණා
I will speak English	මම ඉංග්‍රීසි කතාකරාවි
I will be speaking English	මම ඉංග්‍රීසි කතාකරමින් ඉඳීවි
I will have spoken English	මම ඉංග්‍රීසි කතාකරලා තියේවි
I have been speaking English	මම ඉංග්‍රීසි කතාකරමින් ඉන්නවා **(කාලයක සිට)**
I had been speaking English	මම ඉංග්‍රීසි කතාකරමින් හිටියා **(කාලයක සිට)**
I will have been speaking English	මම ඉංග්‍රීසි කතාකරමින් ඉඳීවි **(කාලයක සිට)**
From Modal verbs	
I can speak English	මට ඉංග්‍රීසි කතාකරන්න පුළුවන්
I could speak English	මට ඉංග්‍රීසි කතාකරන්න පුළුවන් වුනා
I will be able to speak English	මට ඉංග්‍රීසි කතාකරන්න පුළුවන් වේවි
I should/must speak English	මම ඉංග්‍රීසි කතාකළ යුතුයි
I could have spoken English I would have spoken English I may have spoken English	මට ඉංග්‍රීසි කතාකරන්න තිබුණා **(යමක් කිරීමට හැකියාව තිබියදීත් නොකර සිටීම)**
I should have spoken English	මම ඉංග්‍රීසි කතාකළ යුතුව තිබුණා
I may speak English	මම ඉංග්‍රීසි කතාකරන්නම් (possibility)
Other usage	
I want to speak English	මට ඉංග්‍රීසි කතාකරන්න වුවමනායි
I like to speak English	මම ඉංග්‍රීසි කතාකරන්න කැමතී
I have to speak English	මට ඉංග්‍රීසි කතාකරන්න වෙනවා
I used to speak English	මම ඉංග්‍රීසි කතාකරන්න පුරුදුව හිටියා
I was (about) to speak English	මම ඉංග්‍රීසි කතාකරන්න හැදුවා

STranslator

Infinitive form (Active & Passive)

Why infinitive?

යමක් කිරීමේ අරමුණ, හේතුව හෝ යම් දෙයක් පිළිබඳව යමෙකුගේ අදහස ප්‍රකාශ කිරීමට මෙම ස්වරූපය භාවිත වේ (කතෘ විසින් ක්‍රියාවක් කිරීමක් සිදුනොවේ).

Ex: I want to call you. / I can swim well. / I am to teach English.

මෙහි දී වාක්‍යයෙහි ඇති ප්‍රධාන ක්‍රියාව මගින් කාලය සඳහන් කරනු ලබන අතර **infinitive** කොටසින් කාලය හෝ ක්‍රියාවක් කරනු ලබන බව ප්‍රකාශ නොකරයි.

Usage of infinitives

With to + base verb = infinitive

Ex: I want to buy some fruits. (මට පළතුරු ටිකක් මිලදීගන්න අවශ්‍යය යි)
I'm here to teach you. (මම ඉන්නේ ඔයාට උගන්වන්න)
I was to go there. (මම එහෙ යන්න හිටියේ)

Without to + base verb = bare/zero infinitive

Ex: You should do this. (ඔබ මෙය කළයුතුයි)
I let her go. (මම ඇයට යන්න ඉඩහැරියා)

Forms of infinitives

- Present infinitives **(base form of action verb)**
  Ex: I decided to go to America. (මම ඇමරිකාවට යාමට තීරණය කළා)
  I am to teach you English. (මම ඉන්නේ ඔයාට ඉංග්‍රීසි උගන්වන්න)

- Continuous infinitives **(be + ing verb)**
  Ex: I happened to be waiting for the bus.
  (මට බස් එක එනතෙක් බලාසිටීමට සිදුවුණා)

- Perfect infinitives **(have + past participle)**
  Ex: He pretended to have seen the film.
  (ඔහු චිත්‍රපටය නරඹලා තියෙනවා වගේ හැඟෙව්වා)

- Perfect continuous infinitives **(have been + ing verb)**
  Ex: The woman seemed to have been crying.
  (ගැහැණිය අඬලා තියෙනවා වගේ පේනවා)

- Passive infinitives **(be + past participle)**
  Ex: The government is to be supported by the citizens.
  (පුරවැසියන් විසින් රජයට සහයෝගය ලබාදිය යුතුයි)

SFtranslator

Further Examples

Present infinitives

- She came to collect her books. (ඇය ඇගේ පොත් ගන්න ආවා)
- They need a playground to play. (ඔවුන්ට සෙල්ලම්කිරීමට පිට්ටනියක් අවශ්‍යය යි)
- She asked me how to do this.(මේක කරන්නේ කොහොමද කියලා ඇය මගෙන් ඇහුවා)
- They must leave before 10.00am. (ඔවුන් උදෑසන 10ට පෙර පිටත්විය යුතුයි)
- **I want to be a doctor.** (මට වෛද්‍යවරයෙකු වීමට අවශ්‍යය යි)

Continuous infinitives

- I would really like to be swimming in a pool now.
  (මම මේ වෙලාවේ තටාකයක පිහිනමින් ඉන්න කැමතී - මේ වෙලාවේ දැනෙන දෙය)
- We should be hurrying. We are late! (අපි ඉක්මන් කළ යුතුයි. අපි ප්‍රමාදයි)
- I'm glad to be sitting here. (මෙතන වාඩිවෙලා ඉන්න ලැබීම ගැන මට සතුටුයි)

Perfect infinitives (Already finished actions)

- Someone must have broken the window. (කවුරුහරි ජනේලය කඩලා තියෙනවා)
- That man may have noticed the thief. (අර මිනිහා සොරාව හඳුනගන්න ඇති)
- He seems to have had a bad day. (නරක දවසක් ගතකළා වගේ ඔහුගෙන් පේනවා)

Perfect continuous infinitives (Already finished actions)

- You must have been waiting for hours! (
  ඔයා පැය ගණනක් බලාගෙන ඉඳලා තියෙනවා වගේ)
- They might have been talking before you came in.
  (ඔයා ඇතුළට එන්න පෙර ඔවුන් කතා කර කර ඉඳලා තියෙනවා වගේ)
- He pretended to have been painting all day.
  (මුලු දවසම චිත්‍ර අඳිමින් හිටියා වගේ ඔහු අඟවනවා)

Passive infinitives

- ➢ මෙහි දී ද යම් ක්‍රියාවක අරමුණ ප්‍රකාශ කරනු ලබන අතර infinitive කොටස යටතේ ඇති ක්‍රියාව වෙනත් කෙනෙකුන් විසින් කරනු ලබයි
- ➢ එනම් වාක්‍යයේ කතෘ සිටිය ද අපේක්ෂිත ක්‍රියාව සිදුකරනු ලබන්නා සඳහන් නොකරයි
- ➢ කතෘ වෙනුවෙන් යමක් කිරීම ද මෙමගින් අදහස් කරයි

- Alice could be given a prize for her artwork.
  (ඇලිස්ගේ කලාත්මක කටයුත්තට ත්‍යාගයක් ලබාදෙන්න තිබුණා)
- The door should be shut at night. (රාත්‍රියට දොර වසා තැබිය යුතුයි)
- She was to be appreciated. (ඇයව අගය කරන්නට හිටියේ)
- It is yet to be approved. (එය තවම අනුමත වීමට නියමිතයි / අනුමත වෙලා නැහැ)
- She is hoping to be elected president.
  (ඇය ජනපති ලෙස පත්වීමට බලාපොරොත්තු වෙමින් ඉන්නවා)

SEtranslator

Am/is/are + Infinitive (Be + infinitive)

- යමක් කරන්න ඉන්නවා කියන අදහස
- යමක් කිරීම වෙනුවෙන් සිටිනවා කියන අදහස
- යමක් කිරීමට නියමිතව සිටිනවා කියන අදහස
- මෙහි ක්‍රියාවක වීමක් සිදුනොවේ.

Examples:

- The President is to visit India next month.
  (ඊළඟ මාසයේ ජනාධිපති ඉන්දියාවේ සංචාරය කිරීමට නියමිතයි.)

- I am to tell you. (I'm here to tell you.)
  (මම ඉන්නේ ඔයාට කියන්න.)

- They are to take a written exam.
  (ඔවුන් ලිඛිත විභාගයකට මුහුණදීමට නියමිතයි)

- You are not to do that again.
  (ඔබ එය නැවත නොකළ යුතුයි)

- No food of any kind is to be taken into the examination room.
  (විභාග ශාලාවට කිසිම ආහාරයක් රැගෙන නොයා යුතුයි)

- What am I to do?
  (මට මොනවද කරන්න තියෙන්නේ?)

- He is to teach you English.
  (ඔහු ඉන්නේ ඔබට ඉංග්‍රීසි උගන්වන්න)

Note / සැළකිය යුතුයි

- යමක් කරන්න ඉන්නේ හෝ නියමිතයි යන්න තුල ක්‍රියාවක වීමක් නොමැත. ඒ තුල ඇත්තේ යම් ක්‍රියාවක් සඳහා ඉන්න බවයි.
- මේ තුලින් භෞතිකව යම් ස්ථානයක් තුල සිටිනවා යන්න ප්‍රකාශ කළ නොහැක.
- මම සාදයක ඉන්නවා කියන අදහස අපි නිදසුනක් ලෙස බලමු.

  Ex: I am to a party (wrong / වැරදී)
  I am at a party. (right / නිවැරදී)

SEtranslator

Punctuation Marks – විරාම ලක්ෂණ

Comma (,)

- වචන හෝ වාක්‍යඛණ්ඩ 2ක් හෝ ඊට වැඩි ගණනක් වෙන්කර ලිවීම.
  EX: Kasun, Nimal, Perera and Waruni belong to our group.
- කතෘ හා ක්‍රියාව සහිත පූර්ණ වාක්‍ය සන්ධි පද මගින් සම්බන්ධ කිරීමේ දී පළමු වාක්‍ය අවසානයේ කමාවක් යොදයි.
  EX: It is raining, but they are playing.
- යමක් හඳුන්වාදීමේ වාක්‍යඛණ්ඩ වෙන්කර ලිවීම.
  EX: According to my opinion, it can't be true.
- යමක් පිළිබඳ තොරතුරු දැක්වීමේ වාක්‍යඛණ්ඩ වෙන්කර ලිවීම.
  EX: My father, who is a farmer, always respects his job.
- නාමපදයක් විස්තර කිරීමේ දී යොදාගනියි. (නාම විශේෂණ වෙන්කර දැක්වීම)
  EX: He is very calm, innocent and kind.
- සෘජු හා වක්‍ර කථනයේ දී යොදාගනියි.
  EX: He said, "I'm not a loser."
- ප්‍රතිවිරෝධී වාක්‍යඛණ්ඩ වෙන්කිරීම.
  EX: It's spicy, not hot.

Full stop / Period (.)

- වාක්‍යයක් අවසන් බව දැක්වීම.
  EX: It's my chance.
- කෙටි යෙදුම් සඳහා භාවිත කරයි.
  EX: G.C.E. / O.I.C.
- යමක් හකුලුවා ලිවීමේ දී.
  EX: PhD. / Uni. / No.

Colon (:)

- යම් අදහසක් විශේෂකොට දැක්වීම.
  EX: Here is the second option: to find an investor.
- යම් ලැයිස්තුවක් දැක්වීම.
  EX: This contains: an application, student guide and registration details.
- යම් ප්‍රකාශයක් දැක්වීම.
  EX: One of the great sayings: "Reading makes a full man."

SEtranslator

Semi-Colon (;)

- එකිනෙකට අදාල පූර්ණ වාක්‍ය දෙකක් සන්ධි පදයක් නොමැතිව සම්බන්ධ කිරීමේ දී.
  EX: It's going to rain; keep your umbrella with you.
- යම් විරුද්ධාර්ථයක් දැක්වීම.
  EX: It is a good method; however, we can't take it into practice.
- දීර්ඝ ලැයිස්තුවක් දැක්වීමේ දී.
  EX: There are many historical places such as Anuradhapura, Polonnaruwa; Sigiriya, Kandy; Dambulla, Rathnapura; and Kelaniya.

Apostrophe (')

- අයිතිය හැඟවීම.
  EX: This is my father's car.
- හකුලුවා ලිවීමේ දී. (contractions)
  EX: I'm / we're / it's

Quotation marks (" ")

- විශේෂ නාමයක්, ප්‍රකාශයක් හෝ උපුටාගැනීමක් එක් කිරීමේ දී.
  EX: It is known as "White house."
  He said, "This is not my duty."

Exclamation mark (!)

- විශ්මයාර්ථ පද සමගින් යොදාගැනේ. (with interjections)
  EX: Oh my god!
- විශේෂ අවධානය යොමුකර ගැනීමේ දී.
  EX: Please look!

Question mark (?)

- ප්‍රශ්නයක් බව හැඟවීම.
  EX: What's your idea? / Do you believe it?

SEtranslator

Brackets / Parentheses ( ), [ ]

- යම් අතිරේක තොරතුරක් එක් කිරීම.
  EX: Michel (former CEO) needs to meet us.
  I have been awarded for my creative works (In 2010).

Hyphen (-)

- සංකීර්ණ නාම විශේෂණ ගොඩනැගීමේ දී (නාම පදයට පෙර)
  EX: A well-organized trip
  A world-famous song
- විශේෂ නාම සමග උපසර්ග යෙදීමේ දී.
  EX: non-Sri Lankan
- සංකීර්ණ වාක්‍යඛණ්ඩ ගොඩනැගීමේ දී.
  EX: Sister-in-law

Slash (/)

- "හෝ" (or) යන පදයට ආදේශකයක් ලෙස යොදයි.
  EX: He or she – He/she
- හකුලුවා ලිවීමේ දී.
  EX: C/C, A/C
- දින හා දශම දැක්වීම.
  EX: 7/6/2018, 1/2

සැළකිය යුතුයි,

- ➢ ශාස්ත්‍රීය ලිපි ලිවීමේ දී හකුලුවා ලිවීම් අවම ලෙස යොදාගන්න.
- ➢ විරාම ලක්ෂණ යොදන ආකාරය පිළිබඳ ගැටලු මතු වූ විට ඔබ ලියූ වාක්‍ය හොඳින් කිහිපවරක් කියවා පැටලිලි සහගත තැන්වලට විරාම ලක්ෂණ යොදන්න.
- ➢ සංකීර්ණ වාක්‍ය ගොඩනැගීමේ දී යොදාගන්නා සන්ධි පද අනුව විරාම ලක්ෂණ වෙනස්වන බව මතක තබාගන්න.

SFtranslator